# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල


| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1041/ 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 21/06/2024<br>පැය 1445 |

## මාධ්‍ය නිවේදනය

**දිය අනතුරු වලට ලක් වූ පුද්ගලයින් සිව් දෙනෙකු බේරා ගැනීමක් - පොලිස් ජීවිතාරක්ෂක ඒකකය .**

**2024.06.20** වන දින සවස් කාලයේ දඹුල්ල පොලිස් වසමේ කණ්ඩලම වැව දකුණු ඉවුර දේවාලය අසල නාන මංකඩෙහි දිය නෑමට ගොස් දියේ ගිලී අනතුරට පත් පුද්ගලයන් තිදෙනෙකු, පොසොන් උත්සවය වෙනුවෙන් ජීවිතාරක්ෂක විශේෂ රාජකාරි යොදවා සිටින දඹුල්ල පොලිස් ජීවිතාරක්ෂක ඒකකයේ

- පොලිස් පරීක්ෂක ප්‍රියන්ත ජයසේකර
- පොලිස් සැරයන් 481 තඹවිට
- පොලිස් සැරයන් 69818 ජයසිරි
- පොලිස් සැරයන් 68528 ප්‍රියශාන්ත

යන නිලධාරීන් කණ්ඩායම විසින් බේරාගෙන මූලික ප්‍රථමාධාර ලබා දීමට කටයුතු කර ඇත .

**දිය අනතුරට පත් පුද්ගලයයින් අවුරුදු 16ත් 20ත් අතර වයස් වල පසුවන කටුගස්තොට ප්‍රදේශයේ පදංචිකරුවන් වේ.**

අනුරාධපුර පොලිස් වසමේදී 2024.06.20 වන දින සවස් කාලයේ බසවක්කුලම වැවෙහි නාන මංකඩක දිය නාමින් සිටි කුඩා දරුවෙකු දියේ ගිලී අනතුරට පත්ව සිටියදී විශේෂ රාජකාරී යොදවා සිටින අනුරාධපුර පොලිස් ජීවිතාරක්ෂක ඒකකයේ

- පොලිස් පරීක්ෂක හේවගේ
- උප පොලිස් පරීක්ෂක රත්නායක
- පොලිස් සැරයන් 2807 සම්පත්
- පොලිස් කොස්තාපල් 84979 රණතුංග
- පොලිස් කොස්තාපල් 90744 නිලංග
- පොලිස් කොස්තාපල් 99848 තිලකසිරි

යන නිලධාරීන් විසින් දරුවා බේරා ගෙන මූලික ප්‍රථමාධාර ලබා දී භාරකරුවන් වෙත යොමු කර ඇත.

**දිය අනතුරට පත් දරුවා වයස අවුරුදු 13ක් වන කුලියාපිටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෙවැනි දිය අනතුරු වලින් වැළකීම සඳහා සැමවිටම දියනෑමට සුදුසු ස්ථාන ලෙස නම් කර ඇති ස්ථාන වලින් හා පොලිස් ජීවිතාරක්ෂක නිලධාරීන් රාජකාරී යොදවා ඇති ස්ථාන වල පමණක් දිය නෑම සිදු කරන ලෙසටත්, ඔවුන්ගේ උපදෙස් නිරතුරුව පිළිපැදීමටත් පොලිසිය විසින් මහජනතාව දැනුවත් කරන අතර මෙවැනි අවස්ථාවලදී කුඩා දරුවන් පිළිබඳව වැඩි අවධානයක් යොමු කරන ලෙසටත් දෙමව්පියන්ගෙන් ඉල්ලා සිටියි.






මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය
පොලිස් මාධ්‍ය කොට්ඨාසය.